# පටුන


පටුන ........ 1

පූර්විකාව ........ 2

විධායක වාර්තාව ........ 3

හැඳින්වීම ........ 4

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය ........ 5

දැක්ම ........ 5

මෙහෙවර ........ 5

සංවිධාන සැලැස්ම ........ 6

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව - 2015 ........ 7

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සභාපතිගේ වාර්තාව - 2015 ........ 8

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂගේ වාර්තාව - 2015 ........ 9

2015 වර්ෂයේ සංවර්ධන කාර්ය සාධනය ........ 11

වැඩිහිටි නිවාස අළුත්වැඩියා සඳහා ආධාර සැපයීම. ........ 11

වැඩිහිටි නිවාස උපකරණ සඳහා ආධාර සැපයීම. ........ 11

වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම - 2015 ........ 12

වැඩිහිටි කමිටු පිහිටුවීම හා රු. 5000 ආධාර ලබාදීම - 2015 ........ 13

රු. 7500 මූල්‍යමය ආධාර ලබාදෙන ලද ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල - 2015 ........ 14

රු. 15000 මූල්‍යමය ආධාර ලබාදෙන ලද දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල - 2015 ........ 14

රු. 25000 මූල්‍යමය ආධාර ලබාදෙන ලද පළාත් වැඩිහිටි බලමණ්ඩල - 2015 ........ 14

ගෘහස්ථ වැඩිහිටි සත්කාරක සේවාව - පුහුණු කිරීමේ වැඩසටහන ........ 15

වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන ........ 16

කතරගම සංචාරක නිකේතනයේ ආදායම් හා වියදම් තොරතුරු-2015 ........ 19

ජ්‍යෙෂ්ඨ පුරවැසි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ........ 20

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය ........ 21

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ගිණුම් ප්‍රතිපත්ති ........ 23

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව ........ 24

ආදායම් සහ වියදම් වාර්තාව ........ 25

අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය ........ 26

උප ලේඛන ........ 27

විගණකාධිපතිගේ මතය ........ 29

විගණකාධිපති වාර්තාව ........ 31

විගණකාධිපති වාර්තාව සම්බන්ධ පිළිතුරු ........ 40

# පූර්විකාව

2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව සමාජ සේවා අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය ලාංකේය වැඩිහිටි ප්‍රජාවගේ උන්නතිය උදෙසා ගනු ලබන ක්‍රියාමාර්ග ප්‍රතිපත්තිමය තීරණ උපායමාර්ගික සැලසුම්වලට අනුකූලව සකස් කරයි.

2015 වර්ෂයේ ශ්‍රී ලාංකේය වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය සාක්ෂාත් කරගැනීමෙහිලා ක්‍රියාත්මක වැඩසටහන්වල කාර්යය සාධනය ශ්‍රී ලාංකික ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත ඉදිරිපත් කිරීම 2015 වර්ෂයේ මෙම වාර්ෂික වාර්තාවේ අරමුණයි.

පනතේ විධිවිධාන ප්‍රකාරව 2015 වර්ෂයේදී වැඩිහිටි ආත්මාභිමානය, ස්වාධීනත්වය, සහභාගීත්වය, රැකවරණය ආරක්ෂා කිරීම උදෙසා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලද අතර වඩාත් ඵලදායී සේවාවක් ඉටු කිරීමට ලැබීමද වාසනාවකි.

තවද වත්මන් රජයේ දින 100 වැඩසටහන මෙන්ම පිහිටවූ ජාතික ආණ්ඩුව යටතේ ද අතීත උරුමයේ කොටස්කරුවන් වූ වැඩිහිටියන් අතරින් අවුරුදු 70ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට රුපියල් දෙදහසක ප්‍රදානයක් ලබා දෙමින් තෘප්තිමත් වැඩිහිටිවියක් උදෙසා කැපවීම සතුටට කරුණකි.

# විධායක වාර්තාව

2015 වර්ෂයේ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ශ්‍රී ලංකාව පුරා ක්‍රියාත්මක කර වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය උදෙසා කැපවී ක්‍රියා කළ අතර ඒ නිසාම 2015 වසරේ සැලසුම් කළ පරිදිම සාර්ථක භෞතික හා මූල්‍ය ප්‍රගතියක් අත්පත් කර ගත හැකි විය.

වත්මන් රජයේ ජාතික ආණ්ඩු ප්‍රතිපත්තිය යටතේ අවුරුදු 70ට වැඩි වැඩිහිටි ප්‍රජාව වෙනුවෙන් රුපියල් දෙදහසක ජීවනාධාර ලබා දීම ප්‍රධාන වූ අතර පැවති අභියෝග ජය ගැනීමට සමාජ සේවා සුබසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ මෙන්ම සමාජ සවිබල ගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය යටතේත් ගරු අමාත්‍යතුමන් සහ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමන්ගේ මඟ පෙන්වීම මෙන්ම අමාත්‍ය කාර්යය මණ්ඩලය මේ පිළිබඳව දක්වන ලද උනන්දුව ද ඉතා අගය කළ යුතුව ඇත.

එමෙන්ම සමාජ සේවා සුබසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලය ද සමාජ සවිබල ගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය යටතේ ලේකම්තුමන් ඇතුළු කාර්යය මණ්ඩලය ද ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ කාර්යය මණ්ඩලය ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි විෂය සම්බන්ධ රාජකාරී ආවරණය කරන නිලධාරී පිරිසට ද විශේෂ ස්තුතිය හිමි විය යුතුය.

# හැඳින්වීම

පසුගිය දශක කිහිපය පුරා සිදුවූ සමාජ, ආර්ථික සංවර්ධනය හේතුකොට ගෙන සෞඛ්‍යය, පෝෂණය හා අධ්‍යාපනය යනාදී අංශවල ක්‍රමික වර්ධනයක් දක්නට ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස උපත් අනුපාතය පහත වැටී අපේක්ෂිත ආයු කාලය ඉහළ යාම මෙරට වැඩිහිටි ජනගහණයේ සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරයි. ඒ අනුව වර්තමානයේ 12.2% ට ආසන්න මට්ටමේ පවතින වැඩිහිටි ජනගහණය ඉදිරි දශකය තුළ දළ වශයෙන් 22% ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

වැඩිහිටි ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සුභසාධන පහසුකම් වර්ධනය කිරීම හා ඔවුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරදීම කළ යුතුය.ඒ සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය කැපවීමෙන් ක්‍රියා කරයි. 2015 වර්ෂයේදී වැඩිහිටි ප්‍රජාව බලගැන්වීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබීය. ග්‍රාමීය වැඩිහිටි කමිටු, ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල හා දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල යනාදිය ලියාපදිංචි කිරීම, ස්වං රැකියා සඳහා මුදල් ආධාර ලබාදීම, මානසික හා අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා මනෝ විද්‍යාත්මක උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා වැඩිහිටි සත්කාරකයන් පුහුණු කිරීම ඒ අතර ප්‍රමුඛස්ථානයක් ගනී.

එමඟින් වැඩිහිටියන් හුදකලාවීම වළක්වා ඔවුන්ගේ සමාජ සහභාගීත්වය වර්ධනය කිරීමත්, කායික, මානසික හා අධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කිරීමත් අපගේ අභිප්‍රාය වේ.

# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ
පනත යටතේ වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය පිහිටුවා ඇත.


## දැක්ම

ශ්‍රී ලාංකික ජනතාවට රැකවරණය තුලින් ක්‍රියාකාරී, ජවසම්පන්න හා
ඵලදායී වැඩිහිටි දිවියක් උදාකිරීම

## මෙහෙවර


වැඩිහිටියන්ගේ නිදහස, රැකවරණය, ආත්මපරිපූර්ණත්වය, සහභාගීත්වය හා
අභිමානය සහතික කිරීමත්, සමාජ සංවර්ධන කාර්යයන්හි
වැඩිහිටියන්ගේ සහභාගීත්වය උනන්දු කරවීමත් හා
දැනුවත් කිරීමේ වැඩසටහන් තුලින්
වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් රැකදීමත්
අපගේ මෙහෙවර වේ.

# සංවිධාන සැලැස්ම



වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
අධ්‍යක්ෂ (1)
සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) (1)
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) (1)
නීති නිලධාරී (1)
ගණකාධිකාරී (1)
පරිපාලන නිලධාරී (1)
වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර - 98
වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර - 2
කළමනාකරණ සහකාර (1)
කළමනාකරණ සහකාර (2)
කළමනාකරණ සහකාර (1)
කළමනාකරණ සහකාර (2)
රියදුරු (2)
කා.කා.ස (1)
කා.කා.ස (1)
කා.කා.ස (1)

# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව - 2015




| නම | තනතුර |
|---|---|
| 1. මහින්ද සෙනවිරත්න | සභාපති |
| 2. සමන් උඩවත්ත මයා | උප සභාපති |
| 3. සුවින්ද.එස්.සිංගප්පුලි මයා | ලේකම් |
| 4. ප්‍රදීප් යසරත්න මයා | කමිටු සාමාජික |
| 5. අතිපූජ්‍ය ගිරාඹේ ආනන්ද අනුනායක හිමි | කමිටු සාමාජික |
| 6. සෝමපාල ලියනගේ මයා | කමිටු සාමාජික |
| 7. නීතිඥ ඩී.මහින්ද කිත්සිරි ද සිල්වා මයා | කමිටු සාමාජික |
| 8. වෛද්‍ය ආනන්ද ජයලාල් මයා | කමිටු සාමාජික |
| 9. ආචාර්ය ඒ.ඒ.ජයන්ත ජයසිරි මයා | කමිටු සාමාජික |
| 10. ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය සුධීර ජයවීර මයා | කමිටු සාමාජික |
| 11. අධිනීතිඥ බී.ඩී.මහිලාල් චන්දිම මයා | කමිටු සාමාජික |
| 12. ආචාර්ය රිඩ්ලි ජයසිංහ මයා | කමිටු සාමාජික |
| 13. කේ.එම්.එස්.ජී.බණ්ඩාර මයා | කමිටු සාමාජික |
| 14. මාලර් ගන්ගාදරන් මහත්මිය | කමිටු සාමාජික |
| 15. නීතිඥ කමල් අමරසිංහ මයා | කමිටු සාමාජික |
| 16. ආචාර්ය නීලා පියසීලී ගුණසේකර මහත්මිය | කමිටු සාමාජික |

# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සභාපතිගේ වාර්තාව - 2015

ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණ දෙන විවිධ සමාජ ආර්ථික ගැටළු හා ප්‍රශ්න අතර මෙරට වැඩිහිටි ජනගහනය සීඝ්‍රයෙන් වර්ධනය වීම, සුවිශේෂී ගැටළුවක් වී ඇත. එහෙයින් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව වෙත පැවරෙන සමාජ වගකීම ද දිනෙන් දින වර්ධනය වන බවක් පෙනෙන්නට තිබෙන හෙයින්, අපගේ වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය හා රැකවරණය උදෙසා කාලීනව උපාය මාර්ගික සැලසුම්කරණ හා ඒවා ක්‍රියාත්මක කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට සිදුවේ.

ඒ අනුව ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාවට නගමින් පෙර වර්ෂවලට වඩා පුළුල් ජාතික මෙහෙවරක් 2015 වර්ෂයේ ඉටු කරන්නට ලැබීම බලවත් වූ සතුටට කරුණකි.

එහිදී වගකීමෙන් යුතුව සුවිශාල කාර්යභාරයක් ඉටු කරන ලද වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සියළුම සාමාජිකයන් මෙන්ම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ඇතුළු කාර්යය මණ්ඩලය හා වැඩිහිටි නඩත්තු මණ්ඩලය ද පැසසුමට ලක් විය යුතුය.

එසේම වැඩිහිටියන්ගේ සුභසාධනය හා ඔවුන්ගේ රැකවරණය සැපයීමේ කාර්යයේදී නන් අයුරින් සහය වූ රාජ්‍ය නොවන සංවිධානවලට ද මාගේ කෘතඥතාවය පළ කරමි.

**මහින්ද සෙනවිරත්න**
ලේකම්
සමාජ සවිබල ගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

## ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂගේ වාර්තාව - 2015

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ ප්‍රතිපත්තිමය තීරණ හා නිශ්චය කරන ලද ක්‍රියාමාර්ග අනුව කටයුතු කරමින් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් 2015 වර්ෂයේ අත්කර ගත් කාර්ය සාධනය පිළිබඳ තොරතුරු සැකවින් පහත දැක්වේ.

**1. රු. 2000 ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව**

වයස අවුරුදු 70 ඉක්මවූ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ රැකවරණය සහ සුභසාධනය සැලසීමේ අරමුණින් 2015 අයවැය යෝජනා යටතේ වැඩිහිටි සුභසාධනය සඳහා අතිරේක ප්‍රතිපාදන රජය විසින් වෙන් කර දෙන ලදී.

වයස අවුරුදු 70ට වැඩි අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් 386080 කට පමණ 2015 වර්ෂයේදී රු. 2000/- දීමනාව ලබා දී ඇත.

**2. ග්‍රාමීය වැඩිහිටි කමිටු පිහිටුවීම හා මූල්‍යාධාර සැපයීම.**

ග්‍රාමීය වැඩිහිටි කමිටු 640 ක් ද ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල 06 ක් ද දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල 02 හා පලාත් වැඩිහිටි බලමණ්ඩල 03 ක් සඳහා රුපියල් මිලියන 3.510 ක මූල්‍යාධාර ලබාදී ඇත.

**3. වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම.**

වර්ෂය තුළ රුපියල් මිලියන 0.815 ක වියදමක් දරා වැඩිහිටියන් 110766 කට වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කරන ලදී.

**4. ස්වං රැකියා ආධාර ලබා දීම**

අවුරුදු 60ට වැඩි අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් උදෙසා ස්වයං රැකියා ආධාර ලබා දීම යටතේ රු.මිලියන 1.991ක වියදමක් දරා වැඩිහිටියන් 120 වෙනුවෙන් ආධාර ලබා දී ඇත.

**5. පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්**

ග්‍රාමීය මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් 331 ක් ප්‍රාදේශිය මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් 331 ක් ද පලාත් මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් 25ක් ද උපදේශනාත්මක දැනුවත් කිරීමේ වැඩසටහන් 02 ක් සඳහා ද රුපියල් මිලියන 9.989 ක මුදලක් වැය කර ඇත.

6 **නොමිලයේ අක්ෂිකාච හා ශ්‍රවණ උපකරණ ලබාදීම.**

2015 වර්ෂය තුළ වැඩිහිටියන් 4873 දෙනෙකුට වෛද්‍ය නිර්දේශයන්ට අනුව අක්ෂිකාච නිකුත් කර ඇති අතර, 323 දෙනෙකුට ශ්‍රවණ උපකරණ ලබා දී තිබේ. වැය වූ මුදල රුපියල් මිලියන 13.085 කි.

**7 ජාත්‍යන්තර වැඩිහිටි දින සැමරුම**

"සුපසන් නගරයක් සොඳුරු වැඩිහිටි වියක් " යන තේමාව යටතේ 2015 වැඩිහිටි දින සැමරුම් උත්සවය, 2015.10.01 දින ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් හා දිවයිනේ නන් දෙසින් පැමිණි වැඩිහිටියන්ගේ සහභාගීත්වයෙන් පවත්වන්නට යෙදුන අතර, ඒ සඳහා වැය වූ මුදල රුපියල් මිලියන 10.270 කි.

***8* වැඩිහිටි නිවාසවලට මූල්‍යාධාර ලබාදීම.**

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය යටතේ පාලක සභාව විසින් කළමනාකරණය කරනු ලබන කතරගම වැඩිහිටි නිවාසය සහ සංචාරක නිකේතනය ද මාලිගාතැන්න එව්ජින් නෝනා අනුස්මරණ වැඩිහිටි නිවාසය ද ඇතලත්ව වැඩිහිටි නිවාස 24ක් සංවර්ධනය කිරීම් සඳහා රුපියල් මිලියන 19.221 ක මුදලක් වැයකර තිබේ.

**9 වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන**

දානපතියන්ගේ පරිත්‍යාග තුළින් 2015 වර්ෂයේදී එක් අයෙකුට මසකට රු. 250/- ක් වන පරිදි වැඩිහිටියන් 51 දෙනෙකුට අඛණ්ඩව මුදල් ආධාර ලබාදීමට හැකිවී තිබේ.

**10 වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය**

වර්ෂය තුළ මණ්ඩලය 45 වාරයක් රැස්වී ඇති අතර, වැඩිහිටියන්ගේ පැමිණිලි 107 ක් අතරින් පැමිණිලි 67 ක් විසඳා අවසන් කරන ලදී. ඒ අනුව නඩත්තු මණ්ඩලයේ කටයුතු සඳහා 2015 වර්ෂයේදී රුපියල් මිලියන 0.929 ක් වැය කොට ඇත.

**11 වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව**

2015 වර්ෂයේදී වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව රැස්වීම් වාර 04 ක් පවත්වා ඇත. වැයවූ මුදල රුපියල් මිලියන 0.384 කි.

2015 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් යටතේ රු. මිලියන 25 ක් ද පුනරාවර්ථන වියදම් යටතේ රු. මිලියන 120 ක ප්‍රතිපාදන වෙන්කරන ලද නමුත්, අක්මුදල් වශයෙන් ලැබී තිබෙන්නේ රු. මිලියන 24.6 ක් හා රු. මිලියන 119.4 පමණි. කෙසේ නමුත්, 2015 වර්ෂය සඳහා පුනරාවර්ථන වියදම් යටතේ රු. මිලියන 118.605 ක මුදලක් ද ප්‍රාග්ධන වියදම් යටතේ රු. මිලියන 25.163 ක් වැඩිහිටි සුබසාධන කටයුතු සඳහා ඍජුව වැය කර ඇත.

සුවින්ද.එස්.සිංගප්පුලි
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

# 2015 වර්ෂයේ සංවර්ධන කාර්ය සාධනය

## වැඩිහිටි නිවාස අළුත්වැඩියා සඳහා ආධාර සැපයීම.

| දිස්ත්‍රික්කය | වැඩිහිටි නිවාසය | ගෙවන ලද මුදල (රු) |
|---|---|---|
| හම්බන්තොට | තංගල්ල යාය වත්ත වැඩිහිටි නිවාසය | 2,750,000.00 |
| මොණරාගල | කතරගම රජයේ වැඩිහිටි නිවාසය | 165,405.52 |
| ගම්පහ | මාලිගාතැන්න රජයේ වැඩිහිටි නිවාසය | 1,761,169.17 |
| කුරුණෑගල | වවුලෑව වැව්තෙරගම වැඩිහිටි නිවාසය | 1,000,000.00 |
| | පොල්ගහවෙල නහකොටාමඩ දිවා මධ්‍යස්ථානය | 241,070.73 |
| | පොල්ගහවෙල හොඳැල්ල වැඩිහිටි මධ්‍යස්ථානය | 100,204.52 |
| පුත්තලම | නාත්තන්ඩිය ජ්‍යේෂ්ඨ පුරවැසි බලමණ්ඩලය | 500,000.00 |
| ගාල්ල | ඇල්පිටිය සමාධි වැඩිහිටි සමිතිය | 500,000.00 |
| අම්පාර | සරණ වැඩිහිටි නිවාසය | 566,341.12 |
| මඩකළපුව | ස්වාමි විපුලානන්ද වැඩිහිටි නිවාසය | 500,000.00 |
| මාතර | පිටබැද්දර දෑරංගල වැඩිහිටි නිවාසය | 1,191,758.49 |
| අනුරාධපුර | සාලියපුර රජයේ වැඩිහිටි නිවාසය | 2,065,255.93 |
| **එකතුව** | | **11,341,727.83** |

## වැඩිහිටි නිවාස උපකරණ සඳහා ආධාර සැපයීම.

| දිස්ත්‍රික්කය | වැඩිහිටි නිවාසය | ගෙවන ලද මුදල (රු) |
|---|---|---|
| කොළඹ | හොරණ මෛත්‍රී වැඩිහිටි නිවාසය | 46,400.00 |
| මහනුවර | ගොඩහේන වැඩිහිටි නිවාසය | 278,428.00 |
| ගම්පහ | මීරිගම සෙත් සෙවන රජයේ වැඩිහිටි නිවාසය | 759,940.00 |
| රත්නපුර | කලවාන ඥානෝදය පදනම | 454,448.00 |
| අම්පාර | දෙහිඅත්තකණ්ඩිය සරණ වැඩිහිටි නිවාසය | 402,099.00 |
| ත්‍රිකුණාමළය | වැඩිහිටි නිවාස හතක් සඳහා | 1,300,000.00 |
| මාතර | කිරින්දපුහුල්වැල්ල කරුණාරත්න සෙත් සෙවණවැඩිහිටි නිවාසය | 1,061,405.00 |
| ශම්බන්තොට | කටුවන ලියනපතිරණ වැඩිහිටි නිවාසය | 112,500.00 |
| අනුරාධපුර | සාලියපුර රජයේ වැඩිහිටි නිවාසය | 2,425,350.00 |
| **එකතුව** | | **6,840,570.00** |

# වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම - 2015

| පළාත | දිස්ත්‍රික්කය | හැඳුනුම්පත් සංඛ්‍යාව |
|---|---|---|
| බස්නාහිර | කළුතර | 5933 |
| | කොළඹ | 7542 |
| | ගම්පහ | 10119 |
| මධ්‍යම | මාතලේ | 2963 |
| | නුවරඑළිය | 3604 |
| | මහනුවර | 8670 |
| දකුණ | හම්බන්තොට | 4257 |
| | ගාල්ල | 7347 |
| | මාතර | 5802 |
| නැගෙනහිර | මඩකලපුව | 2121 |
| | අම්පාර | 4149 |
| | ත්‍රිකුණාමලය | 1718 |
| වයඹ | කුරුණෑගල | 10161 |
| | පුත්තලම | 4906 |
| උතුරු මැද | අනුරාධපුර | 5494 |
| | පොළොන්නරුව | 2922 |
| ඌව | බදුල්ල | 3565 |
| | මොණරාගල | 1905 |
| සබරගමුව | රත්නපුර | 8126 |
| | කෑගල්ල | 4570 |
| උතුර | යාපනය | 2335 |
| | මන්නාරම | 840 |
| | මුලතිව් | 681 |
| | කිලිනොච්චි | 628 |
| | වවුනියාව | 408 |
| **එකතුව** | | **110766** |

## වැඩිහිටි කමිටු පිහිටුවීම හා රු. 5000 ආධාර ලබාදීම - 2015

| පළාත | දිස්ත්‍රික්කය | රු 5000 ආධාර ලබාදුන් කමිටු සංඛ්‍යාව |
|---|---|---|
| බස්නාහිර | කළුතර | 16 |
| | කොළඹ | 12 |
| | ගම්පහ | 89 |
| මධ්‍යම | මහනුවර | 35 |
| | මාතලේ | 14 |
| | නුවරඑළිය | 07 |
| දකුණ | ගාල්ල | 26 |
| | මාතර | 57 |
| | හම්බන්තොට | 35 |
| උතුර | යාපනය | 12 |
| | වවුනියාව | 14 |
| | කිලිනොච්චි | 01 |
| | මන්නාරම | 01 |
| | මුලතිව් | 04 |
| නැගෙනහිර | මඩකලපුව | 43 |
| | අම්පාර | 31 |
| | ත්‍රිකුණාමලය | 14 |
| වයඹ | පුත්තලම | 11 |
| | කුරුණෑගල | 70 |
| සබරගමුව | රත්නපුර | 32 |
| | කෑගල්ල | 28 |
| ඌව | මොණරාගල | 13 |
| | බදුල්ල | 24 |
| උතුරු මැද | අනුරාධපුර | 50 |
| | පොළොන්නරුව | 01 |
| ***එකතුව*** | | **640** |

## රු. 7500 මුල්‍යමය ආධාර ලබාදෙන ලද ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල - 2015

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |
|---|---|---|
| බස්නාහිර | කොළඹ | 01 |
| දකුණ | ගාල්ල | 01 |
| ඌව | බදුල්ල | 01 |
| වයඹ | පුත්තලම | 01 |
| නැගෙනහිර | මඩකලපුව | 01 |
| උතුර | යාපනය | 01 |
| **එකතුව** | | **06** |

## රු. 15000 මුල්‍යමය ආධාර ලබාදෙන ලද දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල - 2015

| පළාත | දිස්ත්‍රික්කය | බලමණ්ඩල ගණන |
|---|---|---|
| වයඹ | පුත්තලම | 01 |
| උතුර මැද | පොළොන්නරුව | 01 |
| **එකතුව** | | **02** |

## රු. 25000 මුල්‍යමය ආධාර ලබාදෙන ලද පළාත් වැඩිහිටි බලමණ්ඩල - 2015

| පළාත | බලමණ්ඩල ගණන |
|---|---|
| බස්නිහිර | 01 |
| උතුර මැද | 01 |
| දකුණ | 01 |
| **එකතුව** | **03** |

## ගෘහස්ථ වැඩිහිටි සත්කාරක සේවාව - පුහුණු කිරීමේ වැඩසටහන

වැඩිහිටියන් සඳහා අවශ්‍යවන්නා වූ රැකවරණය හා හෙද සත්කාර සේවා ලබාදීමේ අරමුණෙන් වැඩිහිටි රැකවරණ ස්වෙච්ඡා සේවකයන් පුහුණු කර සේවයේ යෙදවීමේ වැඩසටහනක් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් ආරම්භ කර ඇත. ඒ අනුව තෝරා ගන්නා ලද 135ක පිරිසක් හට වැඩිහිටියන් රැකබලාගැනීම හා ඔවුන්ට සෞඛ්‍යමය සේවා සැපයීම පිළිබඳ සති තුනක විධිමත් පුහුණුවක් ලබාදී ඇති අතර, මේ වන විට විශේෂයෙන්ම බස්නාහිර පළාත තුල ජීවත් වන අවශ්‍යතාවය ඇති වැඩිහිටියන්ට ඔවුන්ගේ සේවය ලබා ගැනීමට මාහැඟි අවස්ථාවක් උදාවී තිබේ. ඒ සඳහා දිවා කාලයේ පැය 08 ක වැඩමුරයකට රු.750.00 බැගින් ද රාත්‍රි වැඩමුරයකට රු.900.00 බැගින් ද හා පැය 24 ක වැඩමුරයකට රු.1650.00 ක නියමිත ගාස්තුවක් පමණක් අයකරනු ලැබේ.

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ පූර්ණ අධීක්ෂණය යටතේ සේවාව සපයන අතර, සේවාලාභීන්ගේ අවශ්‍යතාවය පරිදි සේවාදායකයකු ලබාගත හැක. එසේම සේවයේ යොදවන සියළු වැඩිහිටි සත්කාරකයන් ආචාරධර්ම පද්ධතියකට යටත්ව කටයුතු කරති.
සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය සහ සෞඛ්‍ය අමාත්‍යාංශය ඒකාබද්ධව පුහුණු වැඩසටහන සැළසුම්කර මෙහෙයවන අතර පුහුණුව සාර්ථකව අවසන් කරන පුහුණුවන්නන්ට විධිමත් සහතික පත්‍රයක් හා හැඳුනුම්පතක් නිකුත් කරනු ලැබේ. එහෙයින් වඩාත් විශ්වාසයකින් යුතුව එකී රැකවරණ ස්වෙච්ඡා සේවකයන්ගේ සේවය තුළින් ලබා ගැනීමට හැකි වී ඇත.

මෙකී වැඩපිළිවෙල නිසා වැඩිහිටියන්ට හා ඔවුන්ගේ පවුල්වලට පමණක් නොව රජය පිළිගත් පුහුණුවකින් පසු වටිනා සහතිකයකට හිමිකම් ලැබීම හා ස්වාධීන උපස්ථායකයෙකු ලෙස සේවය කරමින් ආදායම් ඉපයීමට හැකි වීම නිසා වැඩිහිටි රැකවරණ ස්වෙච්ඡා සේවක පුහුණුව ලැබූවන්හටද යහපතක් සැලසී තිබේ.

දැනට බස්නාහිර පළාත කේන්ද්‍රකොට ගෙන මෙකී වැඩිහිටි රැකවරණ ස්වෙච්ඡා සේවාව ක්‍රියාත්මක වුවද ඉදිරියේදී අනෙකුත් පළාත්වලට ද එය ව්‍යාප්ත කිරීමෙන් සේවා අවශ්‍ය වැඩිහිටියන් සඳහා වඩාත් පුළුල් සේවාවක් ලබාදීමට අදහස් කර තිබේ.

## වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ යෝජනාවක් පරිදි ඉතාමත් අසරණ දිළිඳු තත්වයේ පසුවන අවුරුදු 70 ඉක්මවූ වැඩිහිටියන්ට පිළිසරණක් වීම අරමුණු කොට ගෙන මෙම වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් ආරම්භ කර ඇත.

මෙම වැඩසටහන සඳහා ඕනෑම අයෙකුට මුදල් පරිත්‍යාග කළ හැකි වන අතර, එසේ පරිත්‍යාගශීලීන් විසින් ලබා දෙන මුදල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරා ගන්නා ලද ඉතාමත් දිළිඳු අසරණ වැඩිහිටියන් වෙනුවෙන් මසකට රුපියල් 250/- බැගින් ලබාදීමට කටයුතු කර තිබේ. ප්‍රතිලාභීන් සඳහා මුදල් ලබාදීමේදී මාස 4 කට වරක් එක් ප්‍රතිලාභියෙකු සඳහා රු. 1000/- බැගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත මුදල් ලබාදීම සිදු කරන අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ප්‍රතිලාභියා වෙත මුදල් ලබා දීම සිදු කරනු ලැබේ.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිටින අපගේ නිලධාරියෙකු (වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර නිලධාරී/සමාජ සේවා නිලධාරී) සෑම තුන් මසකට වරක් මෙම ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු සොයා බලනු ලබන අතර ප්‍රතිලාභීන්ට මුදල් ලබා දෙන සෑම අවස්ථාවකම පරිත්‍යාගශීලීන්ව දැනුවත් කරනු ලබයි.

එසේම මෙම වැඩසටහන යටතේ ආධාර ලබාදීමේදී තමන් කැමති අයෙකු හෝ කිප දෙනෙකු තෝරා ගැනීමට හෝ තමන් කැමති ප්‍රදේශයක අයෙකු හෝ කිහිප දෙනෙකු නම් කිරීමට පරිත්‍යාගශීලියාට ද හැකියාව ඇත. එසේ නොමැති නම් එම තෝරාගැනීම මෙම කාර්යාලය මඟින් සිදුකරනු ලබන අතර, ප්‍රතිලාභියාගේ නම, ලිපිනය ඇතුලත් තොරතුරු පරිත්‍යාගශීලියා වෙත ලබාදිමට අප කාර්යාලයෙන් කටයුතු කරනු ඇත.

මෙම වැඩසටහන සඳහා දායකත්වය ලබාදිමට කැමති අයෙකු වේ නම් බත්තරමුල්ල ලංකා බැංකුවේ අංක 5234881 දරණ වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන ගිණුමට ඔබගේ පරිත්‍යාග මුදල් ලබාදිය හැකි අතර, එසේ මුදල් තැන්පත් කිරීමේදි මුදල් තැන්පත් කළ ලදුපතේ පිටපතක් අප වෙත ලබාදිය යුතුය. එසේත් නොමැති නම්, අප කාර්යාලයට පැමිණ ඔබගේ මුදල් පරිත්‍යාග ලබාදිය හැක.

මෙය අසරණ වැඩිහිටියන් වෙනුවෙන් සිදුකරනු ලබන මහඟු පුණ්‍ය කටයුත්තක් වන බැවින් එය තවදුරටත් ව්‍යාප්ත කරමින් වැඩිහිටියන් විශාල පිරිසකට මෙම වැඩසටහනින් සේවයක් සැලසීමට අදහස් කර තිබේ.

ඒ අනුව 2015 වර්ෂයේදී වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහනේ පරිත්‍යාගශීලීන්, ප්‍රතිලාභීන් හා අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පහත සඳහන් කර ඇත.

| අංකය | දායකයාගේ නම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිලාභියාගේ නම | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
|---|---|---|---|---|
| 1 | අනුෂා ගෝකුල ප්‍රනාන්දු මිය | 07 | ඒ.හේමමාලා පෙරේරා මිය | මහරගම |
| | | | එම්.ඒ.පීටර් පෙරේරා මයා | මහරගම |
| | | | ඩබ්.ඩී.ධර්මදාස මයා | මහරගම |
| | | | පී.තෙරේසා ඩිලෙක්, | කැලණිය |
| | | | එච්.විනී ප්‍රනාන්දුමයා | පානදුර |
| | | | ජේ.ඒ. විනිප්‍රිඩා පෙරේරා, | කළුතර |
| | | | ඒ. පී. ධර්මවර්ධන මයා | දැරණියගල |
| 2 | පී.කේ.එස්.සුභෝධිනී මෙනවිය | 1 | එම්.පී. ලිලීමිය | කැලණිය |
| 3 | එච්.බී. තම්තේගම මහතා | 08 | ආර්.ඒ. කරලියන්නෝනාමිය | මිහින්තලේ |
| | | | ඩබ්. පී. ලීලාවතීමිය | තිස්සමහාරාමය |
| | | | එච්.එම්.හේරත්මැණිකේ | ඉබ්බාගමුව |
| | | | ඩී.එම්.ඩිංගිරිඅම්මාමිය | මාස්පොත |
| | | | ඩබ්.පී. ගුණවති මිය | කුණ්ඩසාලේ |
| | | | බී.ඩී. ජේන්නෝනාමිය | රිදීගම |
| | | | ආර්.පී.ඩී. උක්කු මිය, | පඩුවස්නුවර/බ |
| | | | ටී.ඩබ්.පී. අංගෝමිය | මාවනැල්ල |
| 4 | එස්.ඒ. හින්ටිඩ් මහත්මිය | 8 | පී.ආර්.සාදිනෝනා මිය | වරකාපො |
| | | | අයි.පී. සොයිදාමිය | වරකාපොල |
| | | | එම්.පී. පොඩිනෝනාමිය | වරකාපොල |
| | | | ජේ.පී. ලැයිසාමිය | වරකාපොල |
| | | | යසවතී වෙත්තසිංහ | මහරගම |
| | | | කේ.බී.ඇසලින්නෝනාමිය | මහරගම |
| | | | ඒ. සිමියොන්මයා | මීගමුව |
| | | | ඒ. අමරසිරි ද සිල්වාමයා | මීගමුව |
| | | | එම්. එම්. අබේරත්න මයා | තඹුත්තේගම |
| | | | පී. ආර්. සාදිනෝනා මිය | වරකාපොල |
| | | | අයි. පී. සොයිදා මයා | වරකාපොල |
| | | | එම්. පී. පොඩිනෝනා මිය | වරකාපොල |
| | | | ඩබ්. එච්. ලිලියා මිය | වරකාපොල |
| | | | ජේ. පී. ලැයිසා මිය | වරකාපොල |
| | | | ඒ. සිමියොන් මයා | මීගමුව |
| | | | ඒ. අමරසිරි ද සිල්වා මයා | මීගමුව |
| | | | ජේ. එම්. ඇඩ්මන් මයා | මීගමුව |
| 11 | එන්. ඒ. ප්‍රනාන්දු මහත්මිය | 06 | එම්. පීටර් පෙරේරා මයා | මහරගම |
| | | | ආර්. ඒ. කුසුමාවතී මිය | මහරගම |
| | | | ඒ. හේමපාල වික්ටර් මයා | මහරගම |
| | | | ඩබ්. ඩී. ධර්මදාස මයා | මහරගම |

| | | | | |
|---|---|---|---|---|
| | | | ඒ. වික්ටර් මයා | මහරගම |
| | | | කේ. බී. ඇසිලින් නෝනා මිය | මහරගම |
| 12 | ඩී. තම්තේගම මයා | 04 | එම්. ඩී. ලීලාවතී මිය | මහ කුඹුක්කඩවල |
| | | | ආර්. ඩී. පිනී මිය | ගිරිබාව |
| | | | එච්. එම්. හාමිනෝනා මිය | ගිරිබාව |
| | | | ආර්. එම්. ඥානලතා මිය | පොලගහවෙල |
| 13 | ආර්. එම්. කුසුමා කුමාරි මහත්මිය | 01 | ඒ. සුමනාවතී මිය | මිහින්තලේ |
| 14 | ඩබ්. එම්. වත්සලා මහත්මිය | 01 | පී. අස්පත්තියේගෙදර මිය | වත්තේගම |
| 15 | ඒ. එම්. ආර්. ඒ. ජයසුන්දර මහත්මිය | 01 | ආර්. ඇගිනෝනා මිය | කඩුවෙල |
| 16 | නන්දා කරුණාසේන මහත්මිය | 01 | එල්. ඒ. හීන්හාමි | කැළණිය |
| 17 | සුනිලා පෙරේරා මහත්මිය | 01 | අයි. දෝන ඇග්නස් මිය | කැළණිය |
| 18 | තරංගා කරුණාසේන මහත්මිය | 01 | අයි. ඇන්සිනෝනා මිය | කැළණිය |
| 19 | එම්. පී. ගුණදාස මහත්මිය සහ එම්. ඩී. අයි. යූ. ගුණදාස මෙනවිය | 2 | ඒ. සෝමා ගුණවර්ධන මිය | මිනුවන්ගොඩ |
| | | | එම්. පී. විපුලසේන මයා | මිනුවන්ගොඩ |
| 20 | කේ. පී. නිශාන්ත මයා | 01 | එම්. පී. ඇසිලින් නෝනා මිය | දොම්පේ |
| 21 | එම්. එස්. එම්. අෂ්රොෆ් මයා | 01 | අබ්දුල් රස්වාන් මයා | කළුතර |
| 22 | සීලා පියසිංහ මහත්මිය | 01 | එච්. එම්. හේරත්මැණිකේ මිය | ඉබ්බාගමුව |
| 23 | ඉන්ද්‍රානි සෙනවිරත්න මිය | 01 | යසවතී වෙත්තසිංහ මිය | මහරගම |
| 24 | දිලූපා කරුණාරත්න මහත්මිය | 01 | නෝබට් විමලරත්න මයා | පිළියන්දල |
| 25 | විනීතා මල්ලිකා මහත්මිය | 01 | පී. ඒ. සුමනා පෙරේරා මිය | තිඹිරිගස්යාය |
| 26 | ඩී. පී. වික්‍රමාරච්චි මහත්මිය | 01 | එම්. තුසිත රත්න සිල්වා මයා | බලපිටිය |
| 27 | හවීන්ද්‍ර කල්දේරා මහතා | 02 | එච්. බී. පිත්සොහාමි මිය | මාලිම්බඩ |
| | | | ඩබ්. පී. ගුණවතී මෙනවිය | කුණ්ඩසාලේ |

## කතරගම සංචාරක නිකේතනයේ ආදායම් හා වියදම් තොරතුරු - 2015

<table>
<tr><th rowspan="2">මාසය</th><th rowspan="2">කාමර වෙන් කළ ප්‍රමාණය</th><th rowspan="2">ආදායම රු.</th><th colspan="4">වියදම්</th></tr>
<tr><th>ජල බිල්පත් රු.</th><th>විදුලි බිල්පත් රු.</th><th>පවිත්‍ර රු.</th><th>වෙනත්</th></tr>
<tr><td>ජනවාරි</td><td>35</td><td>34,800.00</td><td>16,944.15</td><td>1,777.20</td><td>-</td><td>-</td></tr>
<tr><td>පෙබරවාරි</td><td>34</td><td>29,000.00</td><td>8,352.75</td><td>2,070.00</td><td>-</td><td>-</td></tr>
<tr><td>මාර්තු</td><td>19</td><td>17,800.00</td><td>11,116.65</td><td rowspan="3">5,427.18</td><td>9,875.00</td><td>-</td></tr>
<tr><td>අප්‍රේල්</td><td>33</td><td>52,300.00</td><td>11,532.90</td><td>-</td><td>-</td></tr>
<tr><td>මැයි</td><td>36</td><td>33,500.00</td><td>10,783.65</td><td>9,695.00</td><td>-</td></tr>
<tr><td>ජුනි</td><td>31</td><td>26,200.00</td><td>20,007.75</td><td>2,490.90</td><td></td><td>-</td></tr>
<tr><td>ජූලි</td><td>42</td><td>37,100.00</td><td>13,825.15</td><td>2,490.90</td><td>-</td><td>-</td></tr>
<tr><td>අගෝස්තු</td><td>45</td><td>45,400.00</td><td rowspan="2">18,548.00</td><td>3,900.00</td><td>9,832.00</td><td>-</td></tr>
<tr><td>සැප්තැම්බර්</td><td>04</td><td>3,800.00</td><td>496.20</td><td>-</td><td>-</td></tr>
<tr><td>ඔක්තෝබර්</td><td>-</td><td>-</td><td>4,717.50</td><td>240.00</td><td></td><td>-</td></tr>
<tr><td>නොවැම්බර්</td><td>-</td><td>-</td><td>1,404.15</td><td>276.00</td><td>8,300.00</td><td>-</td></tr>
<tr><td>දෙසැම්බර්</td><td>-</td><td>-</td><td>-</td><td>404.70</td><td>10,000.00</td><td>-</td></tr>
<tr><td>එකතුව</td><td></td><td>279,900.00</td><td>117,232.65</td><td>20,545.08</td><td>47,702.00</td><td>-</td></tr>
</table>

## ජ්‍යෙෂ්ඨ පුරවැසි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

සමාජ සේවා හා සමාජ සුබසාධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ 2007 ජාත්‍යන්තර වැඩිහිටි දිනය නිමිත්තෙන් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය හා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය ඒකාබද්ධව මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට තීරණය කළ අතර, එය 2008 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරා පත් කර ගනු ලබන වයස අවුරුදු 70 ඉක්මවූ තම දරුවන් ඥාතීන් විසින් නොසලකා හැර ඇති, රජයේ විශ්‍රාම වැටුප්, වැන්දඹු විශ්‍රාම වැටුප්, අර්ථසාධක අරමුදල්, ගොවි ධීවර හෝ ස්වයං රැකියා විශ්‍රාම වැටුප් හෝ වෙනයම් සමාජ රක්ෂණ යෝජනා ක්‍රමයක දායකත්වය නොලබන ඉතා අසරණ වූවන් මේ සඳහා දායක කර ගනු ලබන අතර, දිගු කාලීන අසනීප හා ආබාධ සහිත පුද්ගලයන් වෙත ප්‍රමුඛතාවය දක්වනු ලැබේ.

මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා අවශ්‍ය අරමුදල් ලෙස රුපියල් මිලියන 03 ක මුදලක් සුපිරි වාසනා ලොතරැයි අරමුදලින් ලබාදී ඇති අතර, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් එකී මුදල ආයෝජනය කර මාසික විශ්‍රාම වැටුප් ගෙවීම සිදු කරයි.

සුදුසුකම් ලත් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා මසකට රුපියල් 500/- බැගින් ප්‍රතිලාභීන් 89 දෙනෙකු සඳහා මෙම ප්‍රතිලාභ ලබා දෙන ලදී.

## වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය

2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතින් පිහිටුවා ඇති වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සභාපති ඇතුළු සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විතව ක්‍රියාත්මක වේ. වර්තමානයේ මෙහි සභාපති වනුයේ විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරුවරයෙකි.

මෙහි කාර්ය භාරය වන්නේ දරුවන් විසින් නොසලකා හැර ඇති, වයස අවුරුදු 60 ඉක්මවූ, වියපත් දෙමාපියන්ට එම නොසලකා හැර ඇති දරුවන්ගෙන් ජීවත්වීම සඳහා යම් නඩත්තු මුදලක් ලබා දීමය. ඒ අනුව, මෙම දරුවන් විසින් නොසලකා හැර ඇති දෙමාපියන්ගෙන් මණ්ඩලය වෙත පැමිණිල්ලක් ලැබුනු අවස්ථාවකදී, මණ්ඩලය විසින් වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතට අනුකූලව දෙපාර්ශවයම කැඳවා කරුණු විමසා පරීක්ෂණයක් සිදු කොට දෙමාපියන්ගේ මාසික යැපීමට ප්‍රමාණවත් වන නඩත්තු මුදලක් නියම කිරීම සිදු කරනු ලබයි. එලෙස තීරණය කිරීමේදී දරුවන්ගේ මෙන්ම දෙමාපියන්ගේද ආදායම්, යැපීම් අවශ්‍යතා ආදී සියළු සාධක සැලකිල්ලට ගැනීම සිදු කරනු ලබයි.

මෙහිදී දෙමාපියන් නඩත්තු ඉල්ලීමේදී තම දරුවන්ගෙන් මෙන්ම තමන් විසින් දරුකමට හදා ගන්නා ලද දරුවන්ගෙන්ද (Adoped Child) නඩත්තු ඉල්ලීමට හැකියාවක් ඇත. තවද යම් දෙමාපියෙකුගේ වයස අවුරුදු 60 නොඉක්මවනු ලැබුවද ඔහු/ඇය තම එදිනෙදා නඩත්තු සපයා ගැනීමට නොහැකි නිසා ශාරීරික හෝ මානසික ආබාධයකින් පෙලෙන්නේ නම් මෙම පනතේ 24(I) වගන්තිය යටතේ නඩත්තු ඉල්ලා සිටීමේ හැකියා පවතී.

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන ඉල්ලුම්පත් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගැනීමේ පහසුකම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් සපයා ඇත.

නමුත්, මෙම මණ්ඩලයට පවුල් ආරවුල් මෙන්ම ඉඩකඩම් හෝ දේපල සම්බන්ධයෙන් පවුල් අතර පවත්නා ගැටළු විසඳීමට පනත යටතේ නෛතික බලයක් නැත.

මෙම නඩත්තු මණ්ඩලය විසින් ලබා දෙන යම් නඩත්තු ගෙවීමක් පිළිබඳ නියෝගයක් යම් දරුවකු විසින් පැහැරහරින අවස්ථාවකදී පනතේ 32 වගන්තිය ප්‍රකාරව මණ්ඩලයට එම තීරණය බලාත්මක කරවීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයට යොමු කිරීමේ හැකියාව පවතී. එහිදී මහේස්ත්‍රාත් වරයෙකුට එම නියෝගය නඩත්තු අඥාපනත යටතේ කරන ලද අඥාවක් ක්‍රියාවේ යොදවන ආකාරයටම ක්‍රියාත්මක කිරීමේ බලය ඇත.

## වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය - 2015

| | |
|---|---|
| 2015 වර්ෂයේ ලැබී ඇති පැමිණිලි | - 112 |
| ඉඩම් පවුල් ආරවුල් වැනි අදාල නොවන පැමිණිලි | - 09 |
| ඒ අනුව අවසානය තෙක් විභාග කළ පැමිණිලි | 103 |

| | | |
|---|---|---|
| මණ්ඩලය විසින් සමථයට පත් කළ පැමිණිලි | - 58 | 103 |
| විවිධ හේතූන් මත නිශ්ප්‍රභා කළ හා ඉඩ ලබා දිය නොහැකි පැමිණිලි | - 14 | |
| ඉල්ලා අස්කරගන්නා ලද පැමිණිලි | - 04 | |
| දැනට විභාග වෙමින් පවතින පැමිණිලි | - 27 | |

## වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලයේ සාමාජිකයින්

සභාපති - ඩඩ්ලි කරුණාරත්න මයා

ලේකම් - එම්. ජී. පුංචිබණ්ඩා මයා

**මණ්ඩලයේ සාමාජික**

1. ඩී.එල්.ආර්. සුභසිංහ මයා
2. ආචාර්ය ලීල් ගුණසේකර මයා
3. කේ. මර්කණ්ඩු මයා
4. ඒ. ආර්. ඒ. එම්. ලාෆීර් මයා

# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ගිණුම් ප්‍රතිපත්ති

## පොදු ගිණුම් ප්‍රතිපත්ති

(අ) මෙම ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට ඒවා පිළිගත් ගණකාධිකරණ මූලධර්ම හා ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් අනුව පිළියෙළ කර ඇත.

(ආ) උපචිත පදනම මත සකස් කර ඇත.

(ඇ) රජයේ ප්‍රදානයන්

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට ප්‍රධාන වශයෙන් අරමුදල් සපයනු ලබන්නේ මහා භාණ්ඩාගාරයෙන් වන අතර, මෙම ආයතනය වෙළඳ නොවන ආයතනයක් වශයෙන් කටයුතු කරනු ලබයි.

මහාභාණ්ඩාගාරය විසින් පුනරාවර්ථන වියදම් සඳහා දෙනු ලබන ප්‍රධානයන් ආදායම් හා වියදම් ගිණුමට බැර කරනු ලබන අතර, මූලධන වියදම් සඳහා දෙනු ලබන ප්‍රධානයන් මූලධන ප්‍රදානයක් ලෙස ගිණුම් ගත කෙරේ.

**ස්ථාවර වත්කම් ක්ෂය කිරීම්.**

(අ) ක්ෂය ප්‍රතිපත්ති

I. මිළදී ගත් වර්ෂය සඳහා සම්පූර්ණයෙන් ක්ෂය ගණනය කරනු ලබන අතර අවසන් කරන වර්ෂයට ක්ෂය ගණනය කරනු නොලැබේ.

II. පහත පරිදි සරළ මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කර ඇත.

| | | |
|---|---|---|
| වාහන සඳහා | - | 10% |
| ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ සඳහා | - | 15% |
| යන්ත්‍රෝපකරණ හා සවිකිරීම සඳහා | - | 20% |

(ආ) ප්‍රාග්ධන හා පුනරාවර්ථන මුදල් ලැබීම් මූල්‍ය වාර්තාව තුළ ඇතුළත් කොට ඇත.

(ඇ) ස්ථාවර වත්කම් යටතේ පෙන්වන ලද (ලී බඩු හා කාර්යාලීය උපකරණ) වත්කම්වලින් කොටසක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ පවතී.

ඇමුණුම - 1 ඒ

## වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව
## 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව

| විස්තරය | සටහන | 2015 (රු.) | 2014 (රු.) |
|---|---|---|---|
| **ස්ථාවර වත්කම්** | | | |
| ආයෝජන - ස්ථාවර තැන්පතු | | 6,974,959.28 | 6,488,334.23 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | | 10,516,235.67 | 8,351,777.90 |
| වාහන | | 13,640,500.00 | 10,400,000.00 |
| යන්ත්‍රෝපකරණ හා සවිකිරීම් | | 4,949,242.41 | 1,408,056.96 |
| ඉඩම් | | 13,000,000.00 | - |
| | | **49,080,937.36** | **26,648,169.09** |
| **ජංගම වත්කම්** | | | |
| පරිලේඛන/බඩු තොග | 4 | 708,085.30 | 630,815.49 |
| ලැබිය යුතු වාහන ආදායම් | | 881,000.00 | - |
| නොපියවූ උත්සව අත්තිකාරම් | 3 | 6,250.00 | 41,000.00 |
| සේවක ණය | 2 | 3,952,557.00 | 3,595,190.00 |
| ලැබය යුතු බැංකු ගාස්තු | | - | 50,000.00 |
| මුදල් හා මූල්‍යමය ප්‍රභවයන් | 1 | 5,018,513.47 | 3,021,250.04 |
| | | **10,566,405.77** | **7,338,255.53** |
| **මුළු ජංගම වත්කම්** | | **59,647,343.13** | **33,986,424.62** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| විගණන ගාස්තු වෙන්කිරීම් | | 80,000.00 | 80,000.00 |
| කාර්ය මණ්ඩලය සඳහා ණය අරමුදල | 7 | 572,022.56 | 425,527.40 |
| පොදු තැන්පත් | 6 | 4,020.208.87 | 3,718.492.81 |
| උපචිත වියදම් | 5 | 186,319.88 | 60,721.80 |
| පාරිතෝසිත වෙන්කිරීම් | 8 | 10,720.215.00 | 9,447.291.00 |
| වැඩිහිටි ආවරණ කැපකරු අරමුදල | 9 | 324,187.76 | 362,187.76 |
| WHO අරමුදල | | - | 104,613.52 |
| | | **15,902,954.07** | **14,198,834.29** |
| **ජංගම නොවන වගකීම්** | | - | - |
| **මුළු වගකීම්** | | **15,902,954.07** | **14,198,834.29** |
| **මුළු වත්කම්** | | **43,744,389.06** | **19,787,590.33** |
| **ශුද්ධ වත්කම්/ස්කන්ධය** | | | |
| රජයේ ප්‍රදානයන් - (මූලධන) | 10 | 43,744,389.06 | 19,770,735.27 |
| සංචිත | 11 | 27,895,000.06 | 9,100,000.00 |
| සමුච්චිත අතිරික්තය/හිගය | 12 | (13,917,384.62) | (9,083,144.06) |
| **මුළු ශුද්ධ වත්කම/ස්කන්ධය** | | **43,744,389.06** | **19,787,590.33** |

අත්සන් කළේ,
මහින්ද සෙනවිරත්න
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

අත්සන් කළේ,
සුවින්ද එස්. සිංගප්පුලි
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

ඇමුණුම - 1 බී

## වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව
## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## ආදායම් සහ වියදම් වාර්තාව

| විස්තරය | සටහන | 2015 (රු.) | 2014 (රු.) |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| රාජ්‍ය ප්‍රදාන | 20 | 134,003,961.59 | 89,983,264.73 |
| වෙනත් ආදායම් | | 1,468,905.973 | 1,005,562.20 |
| **මුළු ආදායම්** | | **135,472,867.56** | **90,988,826.93** |
| **මෙහෙයුම් වියදම්** | | | |
| පුද්ගල පඩි නඩි | 13 | 54,989,855.75 | 41,428,976.26 |
| ගමන් වියදම් | 14 | 1,908,541.00 | 1,224,052.42 |
| සැපයීම් හා කාර්යාලීය අවශ්‍යතා | 15 | 1,580,016.38 | 1,981,566.14 |
| නඩත්තු වියදම් | 16 | 2,453,787.18 | 599,128.79 |
| ගිවිසුම්ගත සේවා | 17 | 3,817,027.91 | 5,929,680.78 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 18 | 66,657,324.83 | 35,937,720.32 |
| ක්ෂය ප්‍රමාණය | 19 | 6,444,895.19 | 4,490,344.58 |
| **මුළු මෙහෙයුම් වියදම්** | | **137,851,448.24** | **91,591,469.29** |
| **අදාල කාලය සඳහා වූ ශුද්ධ ඌණතාවය** | | **(2,378,580.68)** | **(602,642.36)** |

අත්සන් කළේ,
මහින්ද සෙනවිරත්න
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

අත්සන් කළේ,
සුවින්ද එස්. සිංගප්පුලි
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

ඇමුණුම - 1 සී

# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව
# 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
# අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විස්තරය | 2015 (රු.) | 2014 (රු.) |
|---|---|---|
| **<u>මෙහෙයුම් කටයුතු තුළින් වූ අරමුදල් ප්‍රවාහය</u>** | | |
| මෙහෙයුම් ක්‍රියාවලි අතිරික්තය/ඌණතාවය | (602,642.36) | (602,642.36) |
| **මූල්‍යමය නොවන කාර්යයන්** | | |
| ක්ෂය වීම් | 6,044,895.19 | 4,490,344.58 |
| **ජංගම වත්කම්** | | |
| වර්ෂ අවසාන තොග වැඩිවීම | (77,269.81) | (20,404.23) |
| **ජංගම වගකීම්** | | |
| පාරිතෝෂික | 1,272,924.00 | 2,065,482.00 |
| සේවක ණය ඉතිරියේ වැඩිවීම | 146,495.16 | (73,294.00) |
| නොපියවූ උත්සව අත්තිකාරම් අඩුවීම | 34,750.00 | (19,000.00) |
| ස්ථාවර වත්කම් පොලී වැඩිවීම | (486,625.05) | (616,538.58) |
| ලැබිය යුතු බැංකු ගාස්තු | 50,000.00 | (50,000.00) |
| විගණන ගාස්තු වෙන්කිරීම් වැඩිවීම | - | 20,000.00 |
| සේවක ණය අරමුදල වැඩිවීම | (357,367.00) | 148,604.63 |
| පොදු තැන්පත්වල වැඩිවීම | (301,716.06) | (600,866.52) |
| උපචිත වියදම්වල අඩුවීම | 125,598.08) | (7,605,807.36) |
| WHO අරමුදල | (104,613.52) | - |
| ලැබිය යුතු වාහන ආදායම් | (881,000.00) | - |
| පසුගිය වසරේ ගැලපුම් කිරීම් | (2,455,659.00) | (2000.00) |
| **මෙහෙයුම් කටයුතු තුළින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **1,235,263.43** | **(2,866,121.84)** |
| **ආයෝජන කටයුතු තුළින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | |
| දේපල, යන්ත්‍රෝපකරණ හා සවිකිරීම්වල මිළදී ගැනීම් | (14,991,038.41) | (5,380,203.29) |
| **මූල්‍ය ක්‍රියාවලිවලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(14,991,038.41)** | **(5,380,203.29)** |
| **මූල්‍ය ක්‍රියාවලිවලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| රජයේ ප්‍රදාන - (මූලධන) | 9,996,038.41 | 10,570,735.27 |
| භාණ්ඩාගාරයේ ප්‍රදාන - (වාහන) | 5,795,000.00 | - |
| වැඩිහිටි ආවරණ කැපකරු ක්‍රමය | (38,000.00) | (1,000.00) |
| **මූල්‍ය ක්‍රියාවලිවලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **15,753,038.41** | **10,569,735.27** |
| මුදල් හා මූල්‍යමය ප්‍රභවයන්ගේ ශුද්ධ ඉහලයාම | **1,997,263.43** | **2,323,410.14** |
| කාලපරිච්ඡේදය ආරම්භයේ ඇති මුදල් හා මූල්‍යමය ප්‍රභවයන් | 3,021,250.04 | 697,839.90 |
| කාලපරිච්ඡේදය අවසානයේ ඇති මුදල් හා මූල්‍යමය ප්‍රභවයන් | **5,018,513.47** | **3,021,250.04** |

අත්සන් කළේ,
මහින්ද සෙනවිරත්න
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

අත්සන් කළේ,
සුචින්ද එස්. සිංගප්පුලි
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

# උප ලේඛන

| 2014 රු. | සටහන් 13 | | පුද්ගලික පඩි නඩි | 12/31/2015 රු. |
|---|---|---|---|---|
| 21,682,066.40 | | (I) | වැටුප් හා වේතන | 23,277,607.29 |
| 3,604,843.37 | | (II) | සේවක අර්ථසාදක අරමුදල | 3,738,555.07 |
| 901,210.65 | | (III) | සේවක භාරකාර අරමුදල | 934,638.60 |
| 328,285.92 | | (IV) | අතිකාල | 491,000.71 |
| 72,644.15 | | (V) | නිවාඩු දින වැටුප් | 79,214.00 |
| 9,804,423.86 | | (VI) | ජීවන වියදම් දීමනා | 10,197,140.00 |
| 5,035,501.91 | | (VII) | ජීවන වියදම් දීමනා | 16,271,700.08 |
| **41,428,976.26** | | | **එකතුව** | **54,989,855.75** |

| 2014 රු. | සටහන් 14 | | ගමන් වියදම් | 12/31/2015 රු. |
|---|---|---|---|---|
| 1,164,217.50 | | (I) | දේශීය | 1,908,541.00 |
| 59,834.92 | | (II) | විදේශීය | - |
| **1,224,052.42** | | | **එකතුව** | **1,908,541.00** |

| 2014 රු. | සටහන් 15 | | සැපයීම් හා කාර්යාලීය අවශ්‍යතා | 12/31/2015 රු. |
|---|---|---|---|---|
| 1,466,631.84 | | (I) | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 920,688.02 |
| 502,934.30 | | (II) | ඉන්ධන හා ලිහිසි තෙල් | 643,328.36 |
| 12,000.00 | | (III) | නිල ඇඳුම් | 16,000.00 |
| **1,981,566.14** | | | **එකතුව** | **1,580,016.38** |

| 2014 රු. | සටහන් 16 | | නඩත්තු වියදම් | 12/31/2015 රු. |
|---|---|---|---|---|
| 396,155.14 | | (I) | වාහන | 2,221,756.98 |
| 202,973.65 | | (II) | යන්ත්‍රෝපකරණ හා සවිකිරීම් | 232,030.20 |
| **599,128.79** | | | **එකතුව** | **2,453,787.18** |

| 2014<br>රු. | සටහන්<br>17 | | ගිවිසුම් සේවා | 12/31/2015<br>රු. |
|---|---|---|---|---|
| 166,032.00 | | (I) | ප්‍රවාහන | 199,384.00 |
| 450,892.74 | | (II) | තැපැල් හා විදුලි සංදේශ සේවා | 705,406.40 |
| 866,049.85 | | (III) | විදුලිය සහ ඉන්ධන | 799,534.98 |
| 246,756.00 | | (IV) | පිරිසිදු කිරීමේ ගාස්තු | 266,972.16 |
| 25,990.00 | | (V) | පුවත්පත් | 29,618.50 |
| 33,269.15 | | (VI) | සංග්‍රහ වියදම් | 32,941.00 |
| 51,904.00 | | (VII) | විගණන ගාස්තු | 35,631.00 |
| 451,550.00 | | (VIII) | ජාතික සභාව සඳහා දිමනා | - |
| 987,929.00 | | (IX) | නඩත්තු මණ්ඩලය සඳහා දීමනා | - |
| 582,326.04 | | (X) | අනෙකුත් දීමනා | 468,615.87 |
| 1,500.00 | | (XI) | බැංකු ගාස්තු | 6,000.00 |
| 2,065,482.00 | | (XII) | පාරිතෝෂිකය | 1,272,924.00 |
| **5,929,680.78** | | | **එකතුව** | **3,817,027.91** |

| 2014<br>රු. | සටහන්<br>18 | | වෙනත් මෙහෙයුම් වියදම් | 12/31/2015<br>රු. |
|---|---|---|---|---|
| 3,784,490.00 | | (I) | ග්‍රාමීය වැඩිහිටි කමිටු පිහිටුවීම | 2,942,367.00 |
| 458,937.75 | | (II) | හැඳුනුම්පත් නිකුත් කිරීම | 800,365.00 |
| 1,870,962.06 | | (III) | දිවා මධ්‍යස්ථාන පිහිටුවීම හා ස්වයං රැකියා ආධාර ලබා දීම | 1,990,570.00 |
| 1,775,344.88 | | (IV) | ප්‍රකාශන | 1,798,071.00 |
| 3,984,751.00 | | (V) | පුහුණු වැඩසටහන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 9,974,448.50 |
| 7,716,450.00 | | (VI) | වෛද්‍ය සායන පැවැත්වීම, අක්ෂිකාච හා ශ්‍රවණ උපකරණ ලබාදීම | 11,846,330.00 |
| 6,603,329.28 | | (VII) | ජාත්‍යන්තර වැඩිහිටි දිනය සැමරීම | 10,058,794.01 |
| 1,248,180.61 | | (VIII) | වැඩිහිටි නිවාස සඳහා ආධාර ලබාදීම | 8,128,448.76 |
| 301,837.10 | | (IX) | වෙනත් වියදම් | 383,868.50 |
| 5,206,965.44 | | (X) | වැඩිහිටි නිවාස අළුත්වැඩියාව සහ නඩත්තුව | 10,850,471.73 |
| 2,986,472.20 | | (XI) | පුහුණු හා ධාරිතා සංවර්ධනය | 4,041,754.23 |
| - | | (XII) | නඩත්තු මණ්ඩලය සඳහා දීමනා | 929,470.50 |
| - | | (XIII) | 2000/-දීමනාවේ පරිපාලනමය වියදම් | 2,912,365.60 |
| **35,937,720.32** | | | **එකතුව** | **66,657,324.83** |

| 2014<br>රු. | සටහන්<br>19 | | ක්ෂය ප්‍රමාණය | 12/31/2015<br>රු. |
|---|---|---|---|---|
| 1,968,476.02 | | (I) | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 2,617,518.09 |
| 1,655,000.00 | | (II) | වාහන | 2,154,000.00 |
| 866,868.56 | | (III) | යන්ත්‍රෝපකරණ හා සවිකිරීම් | 1,672,877.10 |
| **4,490,344.58** | | | **එකතුව** | **6,444,895.19** |

## විගණකාධිපතිගේ මතය

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2000 අංක 09 වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 20(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්ථාවක් සභාවේ සභාපති වෙත යථාකාලයේදී නිකුත් කරනු ලැබේ.

## තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එල්ඊඩබ්/ සී/එන්සීඊ/1/15/06   මබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2015 සැප්තැම්බර් 29 දින

සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

**වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 20(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපති වෙත යථාකාලයේදී නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34   +94-11-2887223   oaggov@sltnet.lk   www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI-1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

3

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

රාජ්‍ය ප්‍රදානයන් ගිණුම්ගත කිරීමේදී යොදාගනු ලබන ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ සහ 2012 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු එකතුව රු.14,895,000 ක් වටිනා මෝටර් වාහන 02 වෙනුවෙන් ක්‍රමක්ෂය ගණනය කර මූල්‍ය ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සභාව වෙත පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු රු.13,000,000 ක් වටිනා ඉඩම පරිත්‍යාග ලෙස සටහන් කිරීම වෙනුවට ඉඩම් වශයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන් කර තිබුණි.

(ආ) පුහුණු හා දැනුවත් කිරීම් සඳහා දරන ලද රු.288,264 ක වියදම ප්‍රාග්ධන වියදම ලෙස ගිණුම් ගත කර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌණතාවය රු.288,264 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) කතරගම වැඩිහිටි නිවාසය හා මාර්ගෝපදේශ මධ්‍යස්ථානයේ නිශ්චල හා චංචල දේපල ජාතික සභාවට පවරාදී තිබුණද, එම වත්කම් තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 2,378,580 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.602,642 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සසඳන විට සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,775,938 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. රජයේ ප්‍රදාන රු.44,020,697 කින් වැඩිවී තිබුණද සමාලෝචිත වර්ෂයට අදාල වියදම් රු.46,259,979 ක් වැඩිවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය ප්‍රතිපාදන සැලකිල්ලට ගැනීමේදී 2012 වර්ෂයේ සිට සභාවේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත 13 වන වගන්තියට අනුව පහත සඳහන් කර්තව්‍යයන් ඉටුකළ යුතු වේ.

- වැඩිහිටි තැනැත්තන්ගේ සුභසාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම පිළිබඳව රජයට උපදෙස් දීම, ශ්‍රී ලංකාවේ පාරම්පරික සාරධර්ම මත පදනම් වූ පවුල් ඒකකය ශක්තිමත් කිරීම සඳහා රජයට හා අනෙකුත් සුදුසු ආයතන වලට වැඩසටහන් නිර්දේශ කිරීම.

- වැඩිහිටි තැනැත්තන්ගේ සුභසාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සඳහා අදාල අමාත්‍යාංශ, පළාත් බල මණ්ඩල, පළාත් පාලන ආයතන,දිස්ත්‍රික් ලේකම් කාර්යාල,ආගමික ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශයේ සංවිධාන වලින් විමසා අවශ්‍ය විය හැකි සියලු පියවර ගැනීම.

- වැඩිහිටි තැනැත්තන් පිළිබඳ නිවැරදි හා යථාවත් කරන ලද සංඛ්‍යා ලේඛන පවත්වා ගෙන යෑම.

- අනාථ වැඩිහිටි තැනැත්තන් සඳහා නවාතැන් සහිතව සුභසාධන මධ්‍යස්ථාන, ක්‍රීඩා මධ්‍යස්ථාන, දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ වෙනත් සුදුසු ආයතන පිහිටුවීම සඳහා දිරි ගැන්වීම් සහ එවැනි මධ්‍යස්ථානවලට හා ආයතනවලට අවශ්‍ය පහසුකම් සලසා දීම,

- වැඩිහිටි තැනැත්තන් වෙනුවෙන් සෞඛ්‍ය රක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම හා ක්‍රියාවේ යෙදවීම.

- අවශ්‍ය නීති උපදෙස් ලබාගැනිමට වැඩිහිටි තැනැත්තන්ට පහසුකම් සැලසීම සහ මෙම පනතේ 25 වන වගන්තිය යටතේ සහනයක් ලබා ගැනිමට අවශ්‍ය වැඩිහිටි තැනැත්තන්ට උපකාර කිරීම.

 වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ පනතට අනුව කර්තව්‍යයන් 16 ක් දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැළැස්මට ඉන් කර්තව්‍යයන් 08 ක් පමණක් ඇතුළත් කර ඒ සඳහා රු.47,000,000 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. කෙසේ වුවද එම කර්තව්‍යයන් ඉටු කිරිමේ ප්‍රගතිය පහත පරිදි විය.

(අ) වැඩිහිටි කමිටු සඳහා මූල්‍යාධාර ලබාදීම

(i) සමාලෝචිත වර්ෂයේදී ග්‍රාමීය වැඩිහිටි කමිටු 950 ක් ප්‍රාදේශිය වැඩිහිටි බල මණ්ඩල 75 ක්, දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල 11 ක් සහ පළාත් වැඩිහිටි බලමණ්ඩල 06 ක් වශයෙන් කමිටු 1,042 ක් පිහිටුවිමට රු.5,672,500 ක මුදලක් වෙන් කර තිබූ නමුත් සත්‍ය වශයෙන් පිහිටුවා තිබුණේ ග්‍රාමීය වැඩිහිටි කමිටු 640 ක්, ප්‍රාදේශිය වැඩිහිටි බල මණ්ඩල 06 ක්, දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල 02 ක් හා පළාත් වැඩිහිටි බල මණ්ඩල 03 ක්ද වශයෙන් කමිටු 651 ක් පමණි. ඒ අනුව වැඩිහිටි කමිටු 391 ක් පිහිටුවිමට නොහැකිවි තිබුණු අතර, ඒ සඳහා වෙන්කළ මුදලින් රු.2,322,500 ක් ඉතිරිව පැවතුණි.

(ii) 2011 ජනවාරි 06 දිනැති අංක 2011/01/දරන වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභා චක්‍රලේඛය ප්‍රකාරව ග්‍රාමීය වැඩිහිටි කමිටු නමින් රු.3,500 ක අවම ශේෂයක් සහිතව ඉතිරි කිරිමේ බැංකු ගිණුමක් පවත්වා ගත යුතු නමුත් කමිටු 385 ක ගිණුම් සම්බන්ධයෙන් ශේෂ සනාථ කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ආ) වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම.

සභාව විසින් වයස අවුරුදු 60 ට වැඩි පුද්ගලයන් සඳහා වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරිමට වාර්ෂිකව සැලසුම් කර ඒ සඳහා ප්‍රතිපාදන සලසා දී තිබුණද, නිකුත් කරන ලද හැඳුනුම්පත් ප්‍රමාණය පිළිබඳව ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලින් නිවරදිව තොරතුරු ලබාගැනිමේ ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණි. ඒ හේතුවෙන් මේ දක්වා නිකුත් කරන ලද මුළු වැඩිහිටි හැඳුනුම්පත් සංඛ්‍යාව කොපමණද යන්න විගණනයේදී තහවුරු කර ගැනිමට නොහැකිවිය.

(ඈ) ස්වයංරැකියා සඳහා මුදල් ආධාර සැපයීම

---

වැඩිහිටි තැනැත්තන්ගේ සුභ සාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම යන අරමුණට අනුකූලව ජ්‍යෙෂ්ඨ පුරවැසියන් උදෙසා ස්වයං රැකියා ආධාර ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාල 40 ක ස්වයං රැකියාලාභීන් 120 දෙනෙකුට රු.1,750,570 ක් ලබා දී තිබුණි.

මෙම ආධාර මුදල් නියමිත පරිදි ස්වයං රැකියා සඳහා යොදවා ගෙන තිබේද යන්න පිළිබඳව පසුවිපරම් කිරීම සිදුකර තිබුණේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 කින් පමණි. තවද ස්වයං රැකියා ලාභීන් 105 දෙනෙකුගෙන් එම මුදල් ලද බවට තහවුරු කරගෙන නොතිබුණි.

(ඈ) දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් පැවැත්වීම

---

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව වැඩසටහන් 721 ක් සඳහා ඇස්තමේන්තු ගත වියදම රු.10,000,000 ක් විය.

එහෙත් වර්ෂය අවසානයට වැඩසටහන් 672 ක් පමණක් පවත්වා තිබූ අතර , පුහුණු වැඩසටහන් 49 ක් පැවැත්වීමට නොහැකිවී තිබුණි. පවත්වන ලද වැඩසටහන් සම්බන්ධයෙන් ප්‍රගති වාර්තා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ඉදිරිපත් කර නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු කිසිවක් සිදුකර නොතිබුණි.

(ඉ) වැඩිහිටි නිවාස සුපරීක්ෂණය

---

සමාලෝචිත වර්ෂයේ වැඩිහිටි නිවාස 87 ක් සභාව යටතේ ලියාපදිංචිව තිබුණද ඉන් නිවාස 72 ක් පිළිබඳව සුපරීක්ෂණයක් සභාව විසින් සිදුකර නොතිබුණි.

(ඊ) වැඩිහිටි නිවාස සඳහා මූලාධාර සහ උපකරණ ලබාදීම

---

සමාලෝචිත වර්ෂය තුළදී වැඩිහිටි නිවාසවලට උපකරණ මිළදී ගැනීමට සහ ගොඩනැගිලි පුනරුත්ථාපනය කිරීමට පිළිවෙලින් රු.8,280,120 ක් සහ රු.10,941,728 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) උපකරණ මිලදී ගැනීමට ලබාදුන් මුදලින් රු.8,128,448 ක් වියදම් කර තිබුණු අතර ඉල්ලුම් කරන ලද උපකරණම මිලදී ගෙන තිබේද යන්න පසුවිපරම් කිරීමක් වැඩිහිටි ලේකම් කාර්යාලය විසින් සිදුකර නොතිබුණි.

(ii) ගොඩනැගිලි පුනරුත්ථාපනය කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා රු.10,880,471 ක් ලබාදී තිබුණි. එම අළුත්වැඩියා වලට අදාල මාසික ප්‍රගතිය වැඩිහිටි ලේකම් කාර්යාලය වෙත වාර්තා කළයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(උ) පනතේ අරමුණු ඉටු නොකළ අවස්ථා

---

2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 13 වගන්තිය ප්‍රකාර වැඩිහිටි තැනැත්තන් සඳහා ජාතික සභාව විසින් පහත සඳහන් කර්තව්‍යන් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(i) ශ්‍රී ලංකාවේ පාරම්පරික සාරධර්ම මත පදනම් වූ පවුල් ඒකකය ශක්තිමත් කිරීම සඳහා රජයට හා අනෙකුත් සුදුසු ආයතන වලට වැඩසටහන් නිර්දේශ කිරීම

(ii) වැඩිහිටි තැනැත්තන් පිළිබඳ නිවැරදි හා යථාවත් කරන ලද සංඛ්‍යා ලේඛන පවත්වා ගෙන යෑම.

(iii) වැඩිහිටි තැනැත්තන්ගේ ගැටළුවලට බලපාන ප්‍රධාන හේතු සහ ඔවුන්ගේ අවශ්‍යතාවයන් හා අභිලාෂයන් හඳුනා ගැනීමේ අදහසින් අධ්‍යයනයන් හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම හා ඒ හේතු මර්දනය කිරීම හෝ මුලිනුපුටා දැමීම සඳහා සහ ඔවුන්ගේ ඒ අවශ්‍යතා හා අභිලාෂ ඉටුකිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

(iv) වැඩිහිටි තැනැත්තන්ගේ ගැටළු අවශ්‍යතාවයන් හා අභිලාෂයන් පිළිබඳව මහජනයා දැනුවත් කිරීමේ අරමුණින් අධ්‍යනයන් හා පර්යේෂණවල සොයා ගැනීම්වලට සුදුසු සියලු ක්‍රියා මාර්ග මගින් නිසි ප්‍රචාරයන් ලබාදීම.

(v) වැඩිහිටි තැනැත්තන්ගේ තත්ත්වය නගාලීම සඳහා රජය විසින් සහ ස්වේච්ඡා සංවිධාන හා පුද්ගල මණ්ඩල විසින් ආරම්භ කරන ලද හා ක්‍රියාවේ යොදවනු ලබන වැඩසටහන් හා යෝජනා ක්‍රම සමීක්ෂණය කිරීම හා සම්බන්ධීකරණය කිරීම.

(vi) වැඩිහිටි තැනැත්තන් වෙනුවෙන් සෞඛ්‍ය රක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම හා ක්‍රියාවේ යෙදවීම.

(vii) වැඩිහිටි තැනැත්තන්ගේ දැන ගැනීම සඳහා වැඩිහිටි තැනැත්තන් සඳහා ඇති වැටුප් ගෙවන හා වැටුප් නොගෙවන රැකියා අවස්ථා පිළිබඳ නාමාවලියක් පවත්වා ගෙන යාම හා හැකි සෑම අවස්ථාවකම ඔවුන්ට ආදායමක් ලැබෙන සේවා නියුක්තියක නිරත වීම සඳහා උපකාර කිරීම.

(viii) මහජනතාවගේ දැනගැනීම සඳහා වැඩිහිටි තැනැත්තන්ගේ සහජ හැකියාවන් සහ දක්ෂතා ඇතුලත් කොට ඔවුන් පිළිබඳ නාමාවලියක් පවත්වාගෙන යෑම.

4.2 කාර්ය මණ්ඩල පරිපාලනය

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර නිලධාරීන් 96 දෙනෙකු පත්කරගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර තිබුණද, එම නිලධාරීන් මඟින් මෙතෙක් ක්‍රියාත්මක නොවූ කර්තව්‍යයන් ඉටුකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අනුයුක්ත කිරීමේදී නිශ්චිත ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම නිසා දිස්ත්‍රික්ක කිහිපයකට නිලධාරීන් පත්කර නොතිබුණි.

(ඇ) සභාවේ සහකාර අධ්‍යක්ෂ (පාලන) තනතුර සහ නීති නිලධාරී තනතුර 2011 වර්ෂයේ සිටම පුරප්පාඩුව පැවතුණි.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැඩිහිටි සුභසාධනය සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පවතින රු.6,974,959 ක ස්ථාවර තැන්පතුව හා එහි වාර්ෂික පොලී ආදායම් වැඩිහිටි සුභසාධන කටයුත්තකට නොයොදා නිශ්කාර්යව පැවතුණි.

(ආ) සභාවේ විවිධ තැන්පතු වශයෙන් රු.4,020,208 ක වගකීමක් ගිණුම්වල සටහන් වී තිබුණු අතර එම වටිනාකමින් රු.1,370,041 ක් නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකිව තිබුණි.

4.4 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම් සහ ගොඩනැගිලිවල ව්‍යාපෘති ආරම්භ කිරීම

2003 අගෝස්තු 22 දින සමාජ සේවා අධ්‍යක්ෂක විසින් කතරගම වැඩිහිටි නිවාසය හා මාර්ගෝපදේශ මධ්‍යස්ථානයට අයත් සියලු නිශ්චල හා චංචල දේපල සභාවට පවරා දී අවුරුදු 12 ක කාලයක් ගතවී තිබුණද එම ඉඩම හා ගොඩනැගිල්ල මැනුම් කර ඔප්පුවක් සකස් කර ගැනීමට කටයුතු නොකර 2004 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අලුත්වැඩියා සහ ඉදිකිරීම් වෙනුවෙන් රු.11,974,436 ක් සභාව විසින් වියදම් දරා තිබුණි.

4.5 සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ ගිණුම්වල පාරිතෝෂික ගෙවීම සඳහා වූ ප්‍රතිපාදනය රු.10,720,215 ක් වූ නමුත් අනාගතයේ උද්ගතවන පාරිතෝෂික ගෙවීමේ අවස්ථාවලදී ඒ සඳහා යොදාගැනීමට හැකිවන පරිදි ඊට සරිලන මුදලක් ආයෝජනය කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

2012 සිට 2016 කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැළැස්ම පිළියෙල කර තිබුණද එය පාලක සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

ක්‍රියාකාරී සැළැස්ම ඉටුකර ගැනීමේ ප්‍රගතිය කාලානුරූපව පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සභාව විසින් හඳුන්වා දී නොතිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

10

6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ජාතික සභාවේ සභාපතිවරයාගේ අවධානය සඳහා යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම් කරණය | - නිසිපරිදි වත්කම් හා පරිත්‍යාග ගිණුම් ගත නොකිරීම. |
| (ආ) කාර්ය මණ්ඩලය | - කාර්ය මණ්ඩල පුරප්පාඩු නොපිරිවීම හා කාර්ය මණ්ඩල අඩුපාඩු හේතුවෙන් කාර්ය සාධනය අපේක්ෂිත මට්ටමට ළඟාකරගත නොහැකිවීම. |
| (ඇ) සැලසුම් කිරීම | - සංයුක්ත හා ක්‍රියාකාරී සැලසුම් සකස්කර නොතිබීම හේතුවෙන් ජාතික සභාව ඉදිරියට මෙහෙයවීමේ අපහසුතා පැවතීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

සමාජසවිබලගැන්වීම්හාසුබසාධනඅමාත්‍යාංශය
சமூகவலுவூட்டல் மற்றும்நலனோம்புகைஅமைச்சு
Ministry of Social Empowerment & Welfare
ජාතිකවැඩිහිටිමහලේකම් කාර්යාලය
முதியோர்களுக்கானதேசியசெயலகம்
National Secretariat for Elders

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව
முதியோர்களுக்கான தேசிய சபை
NATIONAL COUNCIL FOR ELDERS

| | | |
|---|---|---|
| මගේඅංකය / எனதுஇல / My No: NSE/ADM/02/02//General | ඔබේඅංකය / உமது இல / Your No. | දිනය / திகதி / Date: 2016.05. 30 |

ලේකම් මගින්,
සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය.

ඉන්ද්‍රා සෙනෙවිරත්න
ලේකම්
සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන
අමාත්‍යාංශය
01 වන මහල, සෙත්සිරිපාය - II අදියර
බත්තරමුල්ල.

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව.

**වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තා**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් යොමු කරන ලද අංක එල්/ඩබ්/සී/එන්සීඊ/1/15/06 හා 2016.05.24 දිනැති විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි නිරීක්ෂණ කාරුණිකව ඉදිරිපත් කරමි.

02. මූල්‍ය ප්‍රකාශන

2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20 අනුව රාජ්‍ය ප්‍රදාන ගිණුම් තැබීමේදී ක්‍රමක්ෂය මේ වනතුරු මූල්‍ය ප්‍රකාශනවල ගණනය කිරීම් සිදු කර නැත. 2016 වර්ෂයේ අවසන් ගිණුම මගින් 2016 වර්ෂය දක්වා වූ මුළු ක්‍රමක්ෂය ප්‍රමාණය ගැලපීම් සිදු කිරීමට කටයුතු කරමි.

2.2.2 .ගිණුම්කරණ අඩුපාඩු

(අ) පරිත්‍යාග ගිණුමට අදාල රු.1,300,00.00 ක සටහන 2016 වර්ෂයේ අවසාන ගිණුම් මගින් නිවැරදිව ගැලපීම් කර ඉදිරිපත් කරමි.

(ආ) වියදම් ශීර්ෂ 04 ක් සඳහා ඉකුත් වර්ෂ 02 ක තුලදී වියදම් නොවී නැවත ලැබුණු රු.396,598.00 ක ලැබීම් 2016 වර්ෂයේදී පෙර වර්ෂ ලාභ ගැලපුම් ගිණුම මගින් ගැලපීම් සිදු කර අවසාන ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

(ඇ) පුහුණු හා දැනුවත් කිරීම් සඳහා අදාල වන රු.288,264.00 ක වියදමට අදාල අක්මුදල් ලැබීම් ප්‍රාග්ධන ලැබීම්වලින් පුනරාවර්ථන ලැබීම්වලට මාරු කිරීමට අදාල සටහන 2016 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි.

(ඈ) 2003.08.22 දිනැති ලිපිය මගින් කතරගම වැඩිහිටි නිවාසය ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට පවරා ඇති අතර මේ වන විට තක්සේරු වාර්ථාව කතරගම ස්ථානභාර නිළධාරි වෙත ලැබී ඇත. මෙය 2016 වර්ෂයේදී ගිණුම්වල සටහන් කිරීමට කටයුතු කරමි.

ලිපිනය : 2 වන මහල, D කොටස, සෙත්සිරිපාය - දෙවන අදියර, බත්තරමුල්ල.
முகவரி : 2 மாடி,Dபிரிவு,செத்சிறிபாய 2வது கட்டிடத் தொகுதி,பத்தரமுல்லைAddress
2nd Floor , Block D, Sethsiripaya- II Stage, Baththaramulla
ඊ-මේල්/ ஈ-மெயில்/ E-mail : nsemss@gmail.com

දුරකථන / தொலைபேசி/ Telephone:
අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director : 0112187045
කාර්යාලය / அலுவலகம் / Office : 0113094543/44
ෆැක්ස්/ பெக்ஸ் / Fax : 0112187015

## 4.1 කාර්ය සාධනය

### (අ) වැඩිහිටි කමිටු සඳහා මූල්‍යාධාර ලබා දීම

i. වැඩිහිටි සංවිධාන ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් පිහිටුවා පවත්වාගෙන යනු ලබන අතර එම සංවිධාන සවිබල ගැන්වීම වෙනුවෙන් මුදල් අධාර ලබා දීම මෙම කාර්යයෙන් සිදුකර ඇත. මෙම සංවිධාන සඳහා ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් ලේකම් හා පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ යන නිළධාරින්ගේ නිර්දේශ මගින් ලැබෙන ඉල්ලීම් සඳහා මුදල් ආධාර ලබා දෙන අතර 2015 වර්ෂයේ ප්‍රමාණවත් ඉල්ලීම් නොලැබුණු හෙයින් සැලසුම් කරන ලද ප්‍රමාණයට එම ආධාර ලබා දීමට නොහැකි විය.

ii. වැඩිහිටි සංවිධාන සඳහා මුදල් ආධාර ලබා දීමෙදී එම මුදලින් රු.3500/=ක් ගිණුමෙහි තැන්පත් කල බවට සනාථ කිරීම් ඉදිරිපත් නොකළ කමිටු සම්බන්ධව කඩිනමින් අදාල සනාථ කිරීම් ඉදිරිපත් කරන ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත දන්වා යවා ඇත. මේ අනුව කඩිනමින් අදාල තහවුරු ලබා ගැනිමට කටයුතු කර ඒ පිළිබඳව ඔබ වෙත වාර්ථා කිරීමට කටයුතු කරමි.

### (ආ) වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම

වාර්ෂිකව ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් නිකුත් කරනු ලබන මුළු හැඳුනුම්පත් සංඛ්‍යාව කොපමණ ද යන්න සහතික කිරිමට ආකෘතියක් හඳුන්වා දී එයට අනුව තොරතුරු ඉදිරිපත් කරන ලෙස සියලුම ප්‍රාදේශිය ලේකම්වරුන් දැනුවත් කිරීම් කර ඇත. මේ පිළිබඳව නිවැරදි දත්ත ඉදිරියේදී ඔබ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

### (ඇ) ස්වයං රැකියා සඳහා මුදල් ආධාර සැපයීම

විගණනය සිදුවන අවස්ථාවේදී පසු විපරම් කර තිබුණේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 05ක් වුවද 2015.12.31 වන විට තවත් ප්‍රාදේශිය ලේකම් කාර්යාල 05 ක පසු විපරම් කටයුතු සිදුකර අවසන් කර ඇත.
ස්වයං රැකියාලාභින් වෙත මුදල් අධාර නිකුත් කිරිම පිණිස ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත චෙක් පත් නිකුත් කර ඇති අතර , චෙක්පත ලද බවට තහවුරු කිරිම සඳහා ලදුපත් අපවෙත යොමු නොකළ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලදුපත් හැකි ඉක්මණින් එවන ලෙස දන්වා යවා ඇත. ඒ අනුව ලදුපත් කාර්යාලය වෙත ගෙන්වා ඔබ වෙත වාර්ථා කිරීමට කටයුතු කරමි.තවද මින් ඉදිරියට නිකුත් කරන ලද චෙක්පත් සඳහා ලදුපත් ලබා ගැනීම අනිවාර්යයෙන්ම සිදු කල යුතු බවට නිළධාරීන් දැනුවත් කරන ලදී.

### (ඈ) දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් පැවැත්වීම

i. ඉදිරියේදී දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් සම්බන්ධව ප්‍රගතිය නිසි පරිදි වාර්ථා කරන ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇත. 2016 වර්ෂයේදි පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධ නිවැරදි දත්ත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

ii. දැනුවත් කිරීමේ පසුවිපරම් කටයුතු 2016 වර්ෂයේ ආරම්භ කළ අතර එය සාර්ථකව පවත්වාගෙන යාමට කටයුතු කරමි.

( ඉ) වැඩිහිටි නිවාස සුපරික්ෂණය

ඉදිරියේදී වැඩිහිටි නිවාස සුපරික්ෂණ කටයුතු විධිමත්ව සිදුකිරිමට පියවර ගනිමි.

(ඊ) වැඩිහිටි නිවාස සඳහා මූල්‍යාධාර ලබාදීම

i. 2015 මිලදී ගත් උපකරණ පිළිබඳ පසු විපරම් කටයුතු මේ වනවිට සිදුකරමින් සිටින බව කාරුණිකව දන්වා සිටිමි.

ii. ගොඩනැගිලි පුනරුත්ථාපනය සඳහා ලබා දුන් ආධාරවලින් අදාල කාර්යය ඉටුකළ බවට පසු විපරම් කටයුතු මේ වන විට ආරම්භ කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(උ) පනතේ කර්තව්‍යයන් ක්‍රියාත්මක නොකෙරුනු අවස්ථා

( i) ශ්‍රී ලංකාවේ පාරම්පරික සාරධර්ම මත පදනම් වූ පවුල් ඒකකය ශක්තිමත් කිරිම පිළිබදව දේශන, සම්මන්ත්‍රණ හා වැඩමුළු 2016 වර්ෂයේ සිට පැවැත්විමට පියවර ගෙන ඇත.

(iii) වැඩිහිටි තැනැත්තන් පිළිබඳව නිවැරදි හා යථාවත් කරන ලද සංඛ්‍යා ලේඛන පවත්වාගෙන යාමට කොළඹ විශ්ව විද්‍යාලය හා ඒකාබද්ධව පරිගණක දත්ත පද්ධතියක් මේ වනවිට සකස් කරමින් පවතී.

(iv) RDTRI (ග්‍රාමීය සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය) මඟින් දැනට වැඩිහිටි ප්‍රජාව පිළිබඳව තොරතුරු ලබා ගැනීම සඳහා සමීක්ෂණයක් ආරම්භ කර ඇති අතර සියලු වැඩිහිටියන් සඳහා සුදුසු රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරිම සඳහා අවශ්‍ය දත්ත රැස්කිරීම සඳහා ද සමීක්ෂණයක් පැවැත්වීමට කටයුතු සුදානම් කර ඇත.

(v) මෙම සමීක්ෂණ දෙක අවසානයේ සොයාගනු ලබන තොරතුරු (Research Findings) මත සිදු කරනු ලබන ක්‍රියාමාර්ග පිළිබදව මහජනයා දැනුවත් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

(vi) (vii) (ix) (x) - යන කරුණුවලට අදාල සියලුම කාර්යයන් ඉහත සිදුකරනු ලබන සමීක්ෂණ මගින් ලබා ගන්නා සොයාගැනිම් මත සිදු කිරිමට කටයුතු කරන බව දන්වා සිටිමි.

4.2 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) 2016 වර්ෂය වන විට පනතේ ඉටු නොවූ කර්තව්‍යයන් ඉටු කර ගැනීමට පියවර ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයවල සේවය කරන නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. මේ වන විට පනතට අදාලව පහත සඳහන් කාර්යයන් ඉටු කරමින් පවතින බව ද සඳහන් කරමි.

1. වැඩිහිටියන්ගේ සුබසාධනය සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යල මගින් ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ග්‍රාමීය කමිටු, ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල, දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල සහ පළාත් වැඩිහිටි බලමණ්ඩල පිහිටුවීම සිදු කර ඇත.

2. වැඩිහිටියන්ගේ මානසික තත්ත්වය නගා සිටුවීම සඳහා වැඩිහිටි දිවා මධ්‍යස්ථාන පිහිටුවා ඇත.

3. වැඩිහිටියන්ගේ ආර්ථික තත්ත්වය නංවාලීම සඳහා ස්වයං රැකියා සඳහා ආධාර ලබාදීම.

4. අඩු ආදායම්ලාභී වැඩිහිටියන් සඳහා රු. 2000 දීමනාව ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

5. කාත් කවුරුත් නොමැති වැඩිහිටියන් සඳහා වැඩිහිටි නිවාස දිස්ත්‍රික් මට්ටමින් ආරම්භ කිරීමට කටයුතු කිරීම.

(ආ) ආයතනය සඳහා වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාරවරුන් 100 දෙනෙකු අනුමත කර ඇති අතර එයින් දැනට 84 දෙනෙකු පමණක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා අනුයුක්ත කර ඇත. නිලධාරීන් 9 දෙනෙකු පමණක් ප්‍රධාන කාර්යාලයට අනුයුක්තව සේවයේ යෙදී සිටී. මෙම තනතුර විශ්‍රාම වැටුපට හිමිකම් නොලබන සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය සපයන තනතුරක් බැවින් විශ්‍රාම වැටුප් සහිත තනතුරු ලැබීම මත වරින් වර නිලධාරීන් මෙම සේවයෙන් ඉවත් වී යාම සිදුවේ. මේ හේතුවෙන් නිරන්තරයෙන් පුරප්පාඩු ඇති වේ. නිලධාරීන් හිඟකම හේතුවෙන් සියලුම දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීමට හැකියාවක් නොපවතී. එබැවින් මේ වන විටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ප්‍රාදේශීය ලේකම් කාර්යල 331 සඳහාම නිලධාරීන් බඳවා ගැනීම සඳහා තනතුරු අනුමත කර ගැනීමට ලිපි ඉදිරිපත් කර ඇති බව කාරුණිකව සඳහන් කරමි.

(ඇ) සහකාර අධ්‍යක්ෂ (පාලන) තනතුර වැඩ බලන තනතුරක් හෙයින් මෙම තනතුර සඳහා නිලධාරීන් යොමු වීමට අකමැත්තක් ප්‍රකාශ කරන බැවින් එය පුරප්පාඩුව පවතී.

මෙම කාර්යාලයට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබී ඇත්තේ නීති නිලධාරී තනතුරක් නොව නීති සහකාර තනතුරකි. නිති සහකාර යනු රාජ්‍ය සේවයේ MN 4 උපාධිධාරී වැටුප් ක්‍රමයට සමගාමීව මෙම ආයතනයේ ක්‍රියාත්මක MA3 වැටුප් ක්‍රමයේ තනතුරකි. මේ අනුව නීති උපාධි සහතිකය සහිත නිලධාරීන් බොහෝ විට පෞද්ගලික හෝ රාජ්‍ය සේවයේ වෙනත් වරප්‍රසාද ඇති ඉහළ තනතුරු වෙත පත්වීම් ලබා යාමට පියවර ගන්නා හෙයින් මෙම තනතුර සඳහා නිලධාරියෙකු බඳවා ගැනීමට අපහසුතාවයක් පවතින බව සඳහන් කරමි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) මෙම තැන්පතුවේ ඇති මුදල් මගින් වැඩිහිටි පිළිකා රෝගීන්ට ආධාර ලබා දිමට කටයුතු කිරිම සඳහා ජාතික සභා අනුමැතිය ලැබි ඇත. ඒ අනුව ස්ථාවර තැන්පතුව කල් පිරෙන දිනයේදී අදාළ පොළිය ඒ සඳහා යොදා ගන්නා බව දන්වා සිටිමි.

(ආ) පොදු තැන්පතු ගිණුමේ පවත්නා ශේෂ සම්බන්ධව 2016 වර්ෂයේදී සියලු ගැලපීම් කර නිවැරදි ශේෂ ඉදිරියට ගෙන ඒමට කටයුතු කරන බව දන්වා සිටිමි.

## 4.4 වියිමත් පරිදි පවරා නොගත් ඉඩම් සහ ගොඩනැගිලි වල ව්‍යාපෘති ආරම්භ කිරීම

කතරගම වැඩිහිටි නිවාසය හා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය 2003 වර්ෂයේදී ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය වෙත පවරා ඇති අතර 2015 වර්ෂය වන තෙක් අත්කර ගැනීමේ කටයුතු

ආරම්භ කර නොතිබූ බව පිළිගනිමි.එහෙත් 2015/07/28 දින මූ.රෙ.53 මඟින් අත්කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම පිණිස කටයුතු කර ඇති අතර 2016.04.07 දිනැතිව අදාල තක්සේරු වාර්තාව ලැබී ඇත. එහි වර්තමාන තක්සේරු වටිනාකම 33,713,000.00 බව ප්‍රධාන තක්සේරුකරු මේ වන විට දැනුම් දී ඇත. ඒ අනුව ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලියට අනුව ඉදිරියේදී මැනුම්පති විසින් නියමිත පරිදි මැනුම් කටයුතු ඉටුකිරීමට නියමිතව ඇත.අත්කර ගැනීමේ ක්‍රියාවලිය අවසානයේ ඔප්පුවක් සහිතව අත්කර ගැනීමට හැකිවේ.ඉඩම් පනතට අනුව රජයේ ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

එසේම කතරගම වැඩිහිටි නිවාසයෙහි වැඩිහිටියන් නේවාසිකව සිටින බැවින්ද 2003 වර්ෂයේ දී සමාජ සේවා දෙපාර්තමේන්තුව එම ඉඩම් හා ගොඩනැගිලි ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලයට පවරා ඇති හෙයින්ද 2004 වර්ෂයේ සිට අළුත්වැඩියා හා ඉදිකිරීම් සඳහා වියදම් දරා ඇති බව දන්වා සිටිමි.

4.5 මෙම කාර්යාලයේ නිළධාරීන්ගේ පාරිතෝෂිත ගෙවීම සදහා වාර්ෂිකව පාරිතෝෂිත වෙන්කිරීම් ගිණුම් මගින් වෙන් කිරීම කෙරුනත්, ඒ සම්බන්ධව ආයෝජනයක් සිදුකර නොමැත.මේ සම්බන්ධව කලයුතු ඉදිරි කාර්ය පිලිබදව මුදල් අමාත්‍යාංශය සමග දැනටමත් සාකච්ජා කරමින් පවතින අතර මුදල් අමාත්‍යාංශය මගින් ලබා දෙන උපදෙස් අනුව ඉදිරියේදී කටයුතු කර ඔබ වෙත වාර්තා කරමි.

සුචින්ද එස් සිංගප්පුලි
අධ්‍යක්ෂ